# 3

# අල්ලාහ්ගේ ගුණාංග

## (صِفَاتُ اللّٰهِ)

ඉස්ලාමයේ මූලික විශ්වාස හා සිද්ධාන්ත අතර අල්ලාහ් පිළිබඳ විශ්වාසය ප්‍රධාන වේ. එම නිසා අල්ලාහ් පිළිබඳ ඉතා පැහැදිලි ප්‍රතිපත්තියක් ඉස්ලාම් ලබා දී ඇත.

අල්ලාහ් ඒකයා ය. මෙලොව හා එහි ඇති සියලු ම වස්තු මැව්වේ ඔහු ය. මැවූ සියල්ල පරිපාලනය කරන්නෙත් ඔහු ය. මෙලොව සිදු වන සියලු දේ පාලනය කරන්නේ ද ඔහු ය. ස්තුති කළ යුත්තේත් ප්‍රශංසාවට සුදුස්සා වනුයේත් ඔහු පමණි.

සර්ව බලධාරි ඔහුගේ අණපනත් නැමදීමටත් අනුගමනය කිරීමටත් හැකි අණ පනත් වන්නේ ය. ඒවා ප්‍රතික්ෂේප කිරීමට හෝ ඒවාට වෙනස් කම් කිරීමට හෝ නොහැකි ය. මෙසේ ඉස්ලාම් අල්ලාහ් පිළිබඳ ප්‍රතිපත්තිය ඉදිරිපත් කරයි.

"සිෆතුල්ලාහ්" යන අල්ලාහ්ගේ ගුණාංග ගැන දැනගැනීමෙන් මෙම විශ්වාසය තව දුරටත් ස්ථිර කර ගත හැකි ය.

අල්ලාහ්ගේ ප්‍රාණවත් සම භාවය "සිෆතුල්ලාහ්" යන අල්ලාහ්ගේ ගුණාංග මගින් දැක්වේ.

### අල්ලාහ්ගේ ගුණාංග වර්ග තුනකි.

#### 1. වාජිබාත්

වාජිබාත් යනු අල්ලාහ්ට අනිවාර්යයෙන් ම ඇති ගුණාංග වේ. මෙවැනි ගුණාංග 20ක් හඳුන්වා ඇත.

#### 2. මුස්තහීලාත්

අල්ලාහ්ට තිබිය යුතු ඉහත ගුණාංගවලට ප්‍රතිවිරුද්ධ ගුණාංග මුස්තහීලාත් නම් වේ. එනම් අල්ලාහ්ට කිසි විටෙකත් නොමැති ගුණාංග මුස්තහීලාත් මගින් පෙන්නුම් කෙරේ.

අල්ලාහ්ට වාජිබ් වූ හා මුස්තහීල් වූ සිෆත් පහත අයුරින් සැසඳිය හැකි ය.

## වාජිබ් වූ සිෆත්

**(අල්ලාහ් වෙත අනිවාර්යයෙන් තිබිය යුතු ගුණාංග)**

| අල් වාජිබාත් | الوَاجِبَاتُ |
|---|---|
| *1.* තිබීම | ١– وُجُوْدٌ |
| *2.* ආරම්භයක් නොමැතිකම | ٢– قِدَمٌ |
| *3.* ස්ථිර පැවැත්ම | ٣– بَقَاءٌ |
| *4.* මැවුම්වලින් වෙනස් වීම | ٤– مُخَالَفَةٌ لِلْحَوَادِثِ |
| *5.* ස්වාධීන පැවැත්ම | ٥– قِيَامُهُ بِنَفْسِهِ |
| *6.* ඒකයා වීම | ٦– وَحْدَانِيَّةٌ |
| *7.* ප්‍රාණය | ٧– حَيَاةٌ |
| *8.* ඥානය | ٨– عِلْمٌ |
| *9.* කැමැත්ත | ٩– إِرَادَةٌ |
| *10.* ශක්ති | ١٠– قُدْرَةٌ |
| *11.* සවන්දීම | ١١– سَمْعٌ |
| *12.* පෙනීම | ١٢– بَصَرٌ |

| | |
|---|---|
| *13.* කථනය | ١٣– كَلَامٌ |
| *14.* ප්‍රාණය ඇත්තකු වීම | ١٤– حَيٌّ |
| *15.* දැනුමැත්තකු වීම | ١٥– عَالِمٌ |
| *16.* අධිෂ්ඨානවන්තයකු වීම | ١٦– مُرِيْدٌ |
| *17.* ශක්තිවන්තයකු වීම | ١٧– قَادِرٌ |
| *18.* සවන් දෙන්නකු වීම | ١٨– سَمِيْعٌ |
| *19.* දකින අයකු වීම | ١٩– بَصِيْرٌ |
| *20.* කතා කරන්නකු වීම | ٢٠– مُتَكَلِّمٌ |

## මුස්තහීලාත් වූ සිෆත්

**(අල්ලාහ්ට කිසි විටෙකත් නොමැති ගුණාංග)**

| මුස්තහීලාත් | المُسْتَحِيْلَاتُ |
|---|---|
| *1.* නොතිබීම | ١– عَدَمٌ |
| *2.* අලුතින් ඇතිවීම | ٢– حُدُوْثٌ |
| *3.* විනාශ වීම | ٣– فَنَاءٌ |
| *4.* මැවුම්වලට සමාන වීම | ٤– مُمَاثَلَةٌ لِلْحَوَادِثِ |

| | |
|---|---|
| 5. වෙනත් දෙයක් මත පැවතීම | ٥– القِيَامُ بِالْغَيْرِ |
| 6. බොහෝ දෙනකු වීම | ٦– التَّعَدُّدُ |
| 7. මරණය | ٧– مَوْتٌ |
| 8. අඥානවන්තකම | ٨– جَهْلٌ |
| 9. බලකරනු ලැබීම | ٩– كَرَاهَةٌ |
| 10. නොහැකියාව | ١٠– عَجْزٌ |
| 11. බිහිරි බව | ١١– صَمَمٌ |
| 12. අන්ධ බව | ١٢– عَمًى |
| 13. ගොළු බව | ١٣– بُكْمٌ |
| 14. මළ අයකු වීම | ١٤– مَيِّتٌ |
| 15. බලකරනු ලැබූවකු වීම | ١٥– مُكْرَهٌ |
| 16. කිසිවක් නොදත්තෙකු වීම | ١٦– جَاهِلٌ |
| 17. නොහැකි අයකු වීම | ١٧– عَاجِزٌ |
| 18. බිහිරකු වීම | ١٨– اَصَمٌّ |
| 19. අන්ධයකු වීම | ١٩– اَعْمَى |
| 20. ගොළුවකු වීම | ٢٠– اَبْكَمُ |

## 3. ජාඉස් الجَائِزُ

අල්ලාහ්ට තිබිය හැකි හා නොහැකි ගුණාංග නැතහොත් අල්ලාහ් තමාට කැමති දේ කැමති ආකාරයට කිරීමත්, නො කර සිටීමත් ඔහුට ම අදාළ ය යන්න ජාඉස් වශයෙන් දැක් වේ.

උදාහරණ වශයෙන් යහපත් අයට ආනිශංස ලබා දී දුර්ජනයන්ට දඬුවම් පැමිණ වීම, දීම සහ නොදීම ආදිය කිරීමත් නො කර සිටීමත් ඔහුගේ කැමැත්ත වේ.

ඉහත සඳහන් අල්ලාහ්ගේ ගුණාංග ලොව අන් කිසිදු වස්තුවකට තිබිය නොහැකි ලක්ෂණ වන්නේ ය. ආරම්භයක් හා අවසානයක් නොමැති ව විශ්වය පරිපාලනය කරන අල්ලාහ් මැවුම්වලට සමාන නො වී ස්වාධීන ව සිටී යන්න ඔහුගේ අතිමහත් හැකියාවත්, බලයත් විදහා දැක්වීමකි.

මෙම විශ්වය පරිපාලනය කරන අල්ලාහ් මහන්සිය, වෙහෙස, නින්ද වැනි මැවුම් සතු දුර්වලතාවලින් මිදුණු උසස් හැකියා ඇති අයකු හා කිසි විටකත් මරණයට පත් නො වී සදකල් ජීවත්වන්නකු බව ඔහුගේ සිෆත්වලින් මතු කෙරේ.

අල්ලාහ් සතු ගුණාංගවලින්, සවන් දීම, බැල්ම, කතාව යන ඒවායින් ඔහුගේ බලය පෙන්වා දෙයි. ඔහුගේ දෘෂ්ටියට ලක් නොවන කිසිදු තැනක් ලොව නොමැත. ඔහුගේ දෘෂ්ටිය එතරම් පුළුල් ය. ඕනෑ ම කුඩා ශබ්දයක් ඇසෙන තරමට ඔහුගේ ශ්‍රවණය තියුණු ය. එසේ ම ඔහු කතා කරන්නකු හා අණ කරන්නකු වන බව ඔහුගේ 'ආලම්' පැහැදිලි කරන්නේ ය.

"ඔහුට සමාන වූ කිසිවක් නොමැත. සියල්ල සවන් දෙන්නා ඔහු ය. සියල්ල දකින්නා ඔහු ය." (42:11)

මිනිසා මෙලොව පුදුම එළවන සුලු වෙනස්කම් සිදු කර ඇත. මිනිසාගේ දැනුම අල්ලාහ්ගේ දැනුමෙන් ඉතා සුලු කොටසකි. "ඔහු නොදැනුවත් ව පොළොවේ එක දු ශාක පත්‍රයක් හෝ වැටෙන්නේ නැත." (6 : 59) යනුවෙන් අල්කුර්ආන් පෙන්වා දෙන්නේ ය.

විශ්වයේ ශාක වර්ග ඇති වූ දා පටන් අවසන් දිනය දක්වා පොළොවට වැටෙන ගස්වල කොළ ගැන පවා දැනුම ඇත්තේ අල්ලාහ්ට පමණි. සාමාන්‍ය

දැනුමැති මිනිසාට මෙය කළ නොහැකි කාර්යයකි. අල්ලාහ්ගේ දැනුම යන ගුණාංගයේ ප්‍රමාණය මෙම කරුණෙන් පැහැදිලි කෙරේ.

මෙලෙසින් ම අල්ලාහ්ගේ අනෙකුත් ගුණාංගවල ප්‍රමාණය ද පහදා දිය හැකි ය. අල්ලාහ්ට ශුද්ධ වූ නාම 99ක් ඇත. මෙම නාම ඔහුගේ ගුණාංග පැහැදිලි කරන්නේ ය. ඒවා මැවුම්වල ගුණාංගවලට සමාන නො කොට විශ්වාස කළ යුතු වන්නේ ය. නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමා සහ සහාබාවරු වටහා ගෙන විශ්වාස කළ ආකාරයෙන් ම අප ද අල්ලාහ්ගේ ගුණාංග ගැන විශ්වාස කළ යුතු ය. එසේ ම ඔහුගේ ගුණාංගයක් පිළිබඳ ව කිසි විටකත් අවිශ්වාස නො කළ යුතු ය. ඔහු කී පරිදි විශ්වාස කොට අපගේ ඊමානය බලවත් කර ගත යුතු ය.

### අභ්‍යාසය

පහත ප්‍රකාශ හරි නම් (හරි) යැයි ද වැරදි නම් (වැරදි) යැයි ද සඳහන් කරන්න.

1. සිෆාතුල්ලාහ් යනු අල්ලාහ්ගේ ගුණාංග හා ක්‍රියා දක්වන ඒවා ය.( )
2. අල්ලාහ්ගේ ගුණාංග කොටස් හතරකට බෙදා දැක්විය හැකි ය.( )
3. ඉල්මුත් යන්නට ප්‍රතිවිරුද්ධ ගුණාංගය ජහ්ලුන් යන්න ය. ( )
4. අල්ලාහ් අසන්නටත් බලන්නටත් කතා කිරීමටත් ශක්තිය ඇත්තෙකි. ( )
5. කැමති දේ කැමති ආකාරයට කිරීමත් නොකර සිටීමත් වාජිබ් වූ ගුණාංගවල අඩංගු ය. ( )
6. මැවුම්වල දැකිය හැකි දුර්වලතා අල්ලාහ්ට නැත. ( )
7. අල්ලාහ් නොදැන ගහකින් කොළයක් හෝ වැටෙන්නේ නැත.( )
8. අල්ලාහ්ගේ ශුද්ධ වූ නාම ඔහුගේ ගුණාංගවලින් වෙනස් ඒවාය.( )